සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved



දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 13 - 2020**

විභාග අංකය ..............................

# ගෘහ ආර්ථික විද්‍යාව I

කාලය පැය දෙකයි

- **සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**
- **01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළ පිලිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන පිළිතුර තෝරන්න.**

01. මිනිසාගේ අවශ්‍යතාවය අනුව කළමණාකරණය කරනු ලැබූ පරිසරය,
   1. ප්‍රශස්ත ජීවන පරිසරයයි.
   2. සමාජ ජීවන පරිසරයයි.
   3. භෞතික ජීවන පරිසරයයි.
   4. අභ්‍යන්තර ජීවන පරිසරයයි.
   5. ග්‍රාමීය හා නාගරික ජීවන පරිසරයයි.

02. ප්‍රශස්ත ජීවන පරිසර නිර්මාණය හා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
   1. ජීවන පරිසර නිර්මාණයේදී පරිසරය පිළිබඳ අවධානය යොමු කළ යුතුය.
   2. බාහිර පරිසර සාධකවලට සෘජුව නිරාවරණය නොවී ඒවායින් ආරක්ෂා වීමට ජීවන පරිසරය නිර්මාණය විය.
   3. සුව පහසු ලෙස අභ්‍යන්තර අවකාශය සකස් කර ගැනීමට ගල්ගුහාවල කටාරම් කොටන ලදී.
   4. ස්වභාවික මෙන්ම කෘත්‍රිම අමුද්‍රව්‍ය යොදා ගනිමින් විවිධ ආකාරයේ ගොඩනැගිලි නිර්මාණ විය.
   5. මිනිසාගේ අවශ්‍යතාවය අනුව කළමණාකරණය කරනු ලැබූ පරිසරය ප්‍රශස්ත ජීවන පරිසරයයි.

03. උක් යුෂ, මුදවන ලද කිරි හා පැළ වූ මුං ඇට යන ආහාර ද්‍රව්‍යවල අඩංගු කාබෝහයිඩ්‍රේට පිළිවෙළින් වන්නේ,
   1. ලැක්ටෝස්, මෝල්ටෝස්, පිෂ්ඨය ය.
   2. සුක්‍රෝස්, ලැක්ටෝස්, සෙලියුලෝස් ය.
   3. සුක්‍රෝස්, ලැක්ටෝස්, මෝල්ටෝස්ය.
   4. ග්ලූකෝස්, ලැක්ටෝස්, මෝල්ටෝස් ය.
   5. මෝල්ටෝස්, පිෂ්ඨය, ලැක්ටෝස් ය.

04. ඔමේගා 3 මේද අම්ලයේ අණුක සූත්‍රය වන්නේ,
   1. $C_{17}H_{29}COOH$
   2. $C_{17}H_{34}COOH$
   3. $C_{17}H_{31}COOH$
   4. $C_{14}H_{31}COOH$
   5. $C_{17}H_{32}COOH$

05. ලිපිඩ ජීර්ණ ක්‍රියාවලිය හා සම්බන්ධ තෛලෝදකරණ ක්‍රියාව ආරම්භ වනුයේ,
   1. ආමාශයේදී
   2. ග්‍රහණියේදී
   3. කුඩා අන්ත්‍රයේදී
   4. අක්මාවේදී
   5. මහාන්ත්‍රයේදී

06. කැල්සියම්, මැග්නීසියම් හා යකඩ අවශෝෂණයට බාධා කරන නිවුඩු සහල්වල අඩංගු වන්නේ,
   1. කැෆේන්
   2. ඔක්සලික් අම්ලය
   3. ෆයිටික් අම්ලය
   4. ටැනින්
   5. විටමින් D

07. ලෝක සෞඛ්‍ය සංවිධානය අනතුරු අඟවන ආකාරයට 2025 වර්ෂයේ ප්‍රභල සෞඛ්‍යයගැටලුවක් විය හැක්කේ,
   1. ස්ථූලතාවය
   2. හෘද රෝග
   3. දියවැඩියාව
   4. ඩෙංගු
   5. ජලභීතිකාව

08. පෝෂණ ඌණතා හා සම්බන්ධ සාවද්‍ය පිළිතුර වන්නේ,
1. ශ්‍රී ලංකාවේ නුවර එළිය, බදුල්ල, මඩකලපුව යන ප්‍රදේශවල ඌණතා රෝගීන් බහුලය.
2. අත්‍ය අවශ්‍ය පෝෂක කෙටි කාලයක් තුළ ප්‍රමාණාත්මකව ගුණාත්මකව නොලැබීමෙන් තීව්‍ර මන්දපෝෂණය ඇති වේ.
3. ළමා වියේදී ඇතිවන කැල්සියම් ඌණතාවය අස්ථි විකෘති රෝගය නම් වේ.
4. ඇස්වල බිටෝ ලප ඇතිවීම විටමින් A ඌණතාව නිසා ඇති වේ.
5. තයිරොක්සින් හෝර්මෝනය ප්‍රමාණාත්මකව නිපදවීම සඳහා සින්ක් වැදගත් වේ.

09. ආහාර පිරමිඩයේ ඇතුළත් ආහාර කාණ්ඩ ගණන වන්නේ,
1. ආහාර කාණ්ඩ 8 කි. 2. ආහාර කාණ්ඩ 6කි. 3. ආහාර කාණ්ඩ 5කි.
4. ආහාර කාණ්ඩ 9කි. 5. ආහාර කාණ්ඩ 10 කි.

10. සාමාන්‍ය නිරෝගී පුද්ගලයෙකු ආහාර කාණ්ඩ වලින් දිනකට ගතයුතු ප්‍රමාණය හඳුන්වන්නේ,
1. ආහාර සලාකය ලෙසය. 2. ආහාර ප්‍රමාණය ලෙසය. 3. ආහාර පංගුව ලෙසය.
4. ආහාර පිඟාන ලෙසය. 5. ආහාර අතිරේකය ලෙසය.

11. * පපුවේ දැවිල්ල. * උදරය ඉදිරියට නෙරා ඒම හා බඩ පිපුම
* වමනය හා හිසරදය * ආහාර ගැනීමෙන් පසු උදරයේ වේදනාව
ඉහත රෝග ලක්ෂණ ඇතිවිය හැකි රෝගී තත්වය කුමක්ද?
1. ස්ථූලතාවය 2. මලබද්ධය 3. පාචනය 4. ආමාශයික ප්‍රදාහය 5. අතීසාරය

12. ආහාරයට රසයක් ලබාදෙන සැරගතියකින් යුක්ත මිරිස්වල අඩංගු ද්‍රව්‍යයකි.
1. ජින්ජිරෝල් 2. කැප්සෙයින් 3. ලයිකොපීන් 4. පිපෙරීන් 5. සැකරීන්

13. සකසා ගන්නා ආහාරය තාපයට ඉහළින් ස්ථානගත කර පිස ගැනීම හඳුන්වන්නේ,
1. පෝච් කිරීම 2. බාබකියුකිරීම 3. ස්ටු කිරීම
4. බ්‍රේස්ට් කිරීම 5. රෝස්ට් කිරීම.

14. උණුසුම හා සීතල යනුවෙන් සැන්ඩ්විච් වර්ග දෙකකි. ඒ අනුව සීතල සැන්ඩ්විච්වලට උදාහරණයකි,
1. ටෝස්ට් සැන්ඩ්විච් 2. පින්වීල් සැන්ඩ්විච් 3. ක්ලබ් සැන්ඩ්විච්
4. ඕපන් සැන්ඩ්විච් 5. හොට්ඩෝග් සැන්ඩ්විච්


15. වාණිජ මැහුම් ක්‍රම යටතේ සරළම මැහුම්ක්‍රමය නම්,
1. අගුලු මැස්ම 2. තනි නූලේ දම්වැල් මැස්ම 3. නොපෙනෙන මැස්ම
4. අක්වක් මැස්ම 5. ඕවර්ලොක් මැස්ම

16. ක්විල්ට් කිරීමේදී මධ්‍යයේ සිට ක්විල්ට් කිරිමසිදුකරනුයේ,
1. අලංකාර වැඩිකර ගැනීමට 2. ශක්තිමත් බව වැඩිකර ගැනීමට
3. මැසීමේ හැඩය පවත්වා ගැනීමට. 4. මෝස්තරය හොඳින් පෙනීමට.
5. රෙද්දේ රැළි වැටීම වළක්වා ගැනීමට

17. පේෂකර්ම නිෂ්පාදනයට අයත් පියවර දෙකකි,
1. කැඳහරණය හා විරංජනය 2. විරංජනය හා තත්ව පරික්ෂාව
3. කැඳහරණය හා තත්ව පරික්ෂාව. 4. මලහරණය හා ඇසුරුම්කරණය
5. තත්ව පරික්ෂාව හා මලහරණය

18. කෙඳිවල ස්වභාවික වර්ණය ඉවත් කිරීම හඳුන්වන්නේ,
1. කැඳ හරණය 2. මලහරණය 3. විරංජනය
4. මසර කිරීම. 5. සැන්ෆරීකරණය

19. රූප සටහනේ දැක්වෙන රෙදි නිෂ්පාදන ක්‍රමය යොදාගෙන නිපදවනුලබන රෙදි පිළි වනුයේ,



1. පිහිනුම් ඇඳුම්, මදුරු දැල් 2. ටී ෂර්ට්, මේස් 3. පිහිනුම් ඇඳුම්, ටී ෂර්ට්
4. මේස්, මදුරු දැල් 5. තුවා, අත්පිස්නා

20. වමේ සිට දකුණට හෝ දකුණේ සිට වමට නූල්වලින් නැගුණු රේඛාවක් පහත කෙළවරේ සිට ඉහළට ඉලිප්පුණු ස්වභාවයක් පෙන්නුම් කරන වියමන් වනුයේ,
1. ජටා වියමන් 2. දික්දාර වියමන් 3. හිරි වියමන්
4. සැටින් වියමන් 5. සැටීන් වියමන්

21. ෆෙල්ට් කිරීම සඳහා භාවිතා වන කෙඳි වර්ගය නම් කරන්න.
1. කෙටි කපු කෙඳි 2. අර්ධ කෘතීම කෙඳි 3. කෙටි නයිලෝන් කෙඳි
4. කෙටි සේද කෙඳි 5. කෙටි ලෝම කෙඳි

22. විවිධ අවස්ථාවලට උචිත ලෙස පෙනී සිටීම හා සම්බන්ධ කරුණු කිහිපයක් පහත දැක්වේ.
A දැනුම හා පෞරුෂය පිළිබඳ ධනාත්මක සිතුවිල්ලක් ලබාදීම.
B පුද්ගල සනීපාරක්ෂාව
C අන්අය ඉදිරියේ අපහසුතාවයට හා ලැජ්ජාවට පත් නොවීම.
D අන්තර් පුද්ගල සම්බන්ධතා මනාව පවත්වාගතහැකි වීම.
E ඇඳුම් පැලඳුම්වල ස්වභාවය
ඉහත කරුණු අතරින් උචිත ලෙස පෙනී සිටීමේදී සැලකිය යුතු කරුණු ඇතුළත් පිළිතුර කුමක්ද?
1. B, E ය. 2. A, B, C ය. 3. B, C, D ය.
4. C, D ය. 5. A, D, E ය.

23. අන්‍යන්ගේ අවධානය වඩා වැදගත් වන්නේ,
1. ලිඛිත සන්නිවේදනයේදීය. 2. වාචික සන්නිවේදනයේදීය.
3. අවාචික සන්නිවේදනයේදීය. 4. විද්‍යුත් තැපැල මගින් කරන සන්නිවේදනයේදීය.
5. කෙටි පණිවුඩ මගින් කරන සන්නිවේදනයේදීය.

24. අවිධිමත් ක්‍රමයට සංවාද ගොඩනැගීමේදී විශේෂයෙන්ම ආචාර කිරීම සිදු කරන්නේ,
1. සමීපතයන් නොවන අය සමගය. 2. කලක් තිස්සේ හඳුනන පුද්ගලයන් සමගය.
3. විවිධ තරාතිරමේ පුද්ගලයන් සමගය. 4. රැකියා ස්ථානයේ නිලධාරින් සමගය.
5. දේශපාලකයන් සමගය.

25. අරමුණක් සාර්ථකව ඉටුකර ගැනීමට අවශ්‍ය කරන මනා මානසික හා කායික පුද්ගල හැකියාවන් පරීක්ෂාවට ලක් කිරීම හඳුන්වන්නේ,
1. සම්මුඛ පරීක්ෂණ ලෙසය. 2. අභියෝග ලෙසය. 3. සමාජ ආචාර ධර්ම ලෙසය.
4. විශ්වසනීයත්වය ලෙසය. 5. සංවාද ගොඩනැගීම ලෙසය.

26. සම්මුඛ පරීක්ෂණයකදී, ''අවශ්‍ය අවස්ථාවල ඔබ අතිකාල සේවයේ යෙදෙන්නේද'' යන්න විමසීම අයත් ප්‍රශ්න වර්ගය කුමක්ද?
1. විවෘත ප්‍රශ්න 2. ආවෘත ප්‍රශ්න 3. ව්‍යුහගත ප්‍රශ්න
4. දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න 5. කැමැත්ත පරීක්ෂා කිරීමේ ප්‍රශ්න

27. සම්මුඛ පරීක්ෂණයකදී කෙටි පිළිතුරු බලාපොරොත්තු වන්නේ කුමන ප්‍රශ්න වර්ගයෙන්ද?
1. විවෘත ප්‍රශ්න 2. ආවෘත ප්‍රශ්න
3. ව්‍යුහගත ප්‍රශ්න 4. දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න
5. කැමැත්ත පරීක්ෂා කිරීමේ ප්‍රශ්න

28. මාළු පාන්, පේස්ට්‍රි මතුපිට බිත්තර සාරු ආලේප කර රන්වන් දුඹුරු පැහැයක් ලබා ගනී. මෙය සිදුවන්නේ,
1. කැරමලීකරණය නිසාය. 2. ඩෙක්ස්ට්‍රීකරණය නිසාය 3. මෙලාඩ් ප්‍රතික්‍රියාව නිසාය.
4. ඔක්සිකරණය වීම නිසාය. 5. පොලිෆිනෝල් සංයෝග නිසාය.

29. අහාර පරිරක්ෂණය කිරීම නිසා සිදු නොවන්නකි.
1. ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරිත්වය නිශේධනය කිරීම. 2. රසායනික ප්‍රතික්‍රියා නිශේධනය කිරීම.
3. එන්සයිම අක්‍රීය කිරීම. 4. භෞතික හානි අවම කිරීම.
5. පෝෂණ හානි අවම කිරීම.

30. එලවළු වියළීමේදී 0.1% - සෝඩියම් මෙටා බයි සල්ෆයිට් (SMS) ද්‍රාවණය ගිල්වීම කරයි. එසේ කිරීමෙන්,
1. එළවලුවල ආවේනික වර්ණය ආරක්ෂා වේ.
2. එළවළු ඉක්මනින් වියළාගත හැකි වේ.
3. පෝෂණ හානිය අවම වේ.
4. එළවළු මෘදු වීමක් සිදු වේ.
5. අනවශ්‍ය ක්ෂුද්‍රජීවීන් විනාශ වේ.

31. ආහාරයක් වියළීමේ සීඝ්‍රතාව කෙරෙහි බලපාන සාධකයක් නොවන්නේ,
1. ආහාරයේ රසායනික ගුණාංග
2. ආහාරයේ පවතින ජල ප්‍රමාණය.
3. වියළනු ලබන පරිසරයේ භෞතික ගුණාංග
4. ආහාරයේ අන්තර්ගත පෝෂ්‍ය පදාර්ථ.
5. වියළනයේ තාප පරිවහන කාර්යක්ෂමතාව.

32. විවේකය ඵලදායී ලෙස යොදා ගැනීමට නම්,
1. පෙර සැලසුම් සකස් කළ යුතුය.
2. රාජකාරී වේලාවන් අඩුකළ යුතුය.
3. ඒ සඳහා සුදුසු ස්ථාන ඇතිකළ යුතුය.
4. සන්නිවේදන කුසලතා වර්ධනය කළ යුතුය.
5. පවුලේ සාමාජිකයන් අතර වැඩ බෙදාගත යුතුය.

33. ගෘහස්ථ හා ගෘහස්ථ නොවන ප්‍රතිමෝදන ක්‍රියාකාරකමකි.
1. රූපවාහිනිය නැරඹීම හා පරිගණකය භාවිතය.
2. සංගීතයට සවන්දීම හා විවිධ ප්‍රසංගයක් නැරඹීම.
3. නව කතාවක් කියවීම හා කැරම් ක්‍රීඩාවේ යෙදීම.
4. රූපවාහිනිය නැරඹීම හා වෙරළතීරයේ ඇවිදීම.
5. දුරගමන් යාම සහ චෙස් ක්‍රීඩාවේ නිරතවීම.

34. සංචරණය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශ වන්නේ,
1. සංචරණය පුද්ගලයන් විසින් තම විවේක කාලය තුළ කරනු ලබන ප්‍රතිමෝදන ක්‍රියාකාරකමකි.
2. සංචරණයේදී පුද්ගලයෙකු අවම වශයෙන් එක් රැයක්වත් නැවතිය යුතුය.
3. විදේශීය රැකියාවකට ගොස් අවුරුදු 2ක් ගත කිරීම බාහිර යොමුගත සංචරණයයි.
4. සංචරණයේදී ගමන් කරන ස්ථානයෙන් පාරිතෝෂිතයක් අපේක්ෂා නොකරයි.
5. සංචරණය සහ ගමන්කිරීම එකිනෙකට වෙනස්ය.

35. දකුණු ආසියාවේ ජීවත් වන්නෙකුට යුරෝපා රටකට සංචරණය කිරීමේ අවස්ථාවක් ලැබුණි. මෙම සංචරණය හඳුන්වන්නේ,
1. කලාප අභ්‍යන්තර සංචරණය
2. කලාපාන්තර සංචරණය
3. දේශීය සංචරණය
4. අභ්‍යන්තර යොමුගත සංචරණය
5. විකල්ප සංචරණය

36. ශ්‍රී ලාංකික තරුණයෙකු එවරස්ට් කඳුමුදුන තරණය කිරීමට සංචරණය සඳහා පිටත්ව ගියේය. මොහුගේ සංචරණ ප්‍රභේදය වන්නේ,
1. අධ්‍යාපනික සංචරණය
2. අජටාකාශ සංචරණය
3. ප්‍රයාන (වික්‍රමාන්විත) සංචරණය
4. ස්වභාව ධර්ම සංචරණය
5. රූදෙස් සංචරණය

37. පහත දක්වා ඇති සංචාරක ආකර්ෂණ අතරින් මානව පාලිත ආකර්ෂණයක් ඇති ස්ථානය කුමක්ද?
1. උණු දිය උල්පත්
2. මහනුවර දළදා මාලිගාව
3. සිංහරාජ වනාන්තර
4. ඇම්බැක්ක දේවාලය
5. සීගිරිය

38. සංචරණය නිසා ලැබෙන ප්‍රතිලාභ කිහිපයක් පහත දැක්වේ.
A පූර්ණ හා අර්ථවත් ජීවිතයකට දායක විය හැකිය.
B ඍජු හා වක්‍ර රැකියා අවස්ථා උදාවීම.
C නගර අලංකරණය සඳහා පෙළඹවීම.
D අන්තර් පුද්ගල සබඳතා දියුණු වීම.
E සන්නිවේදන නිපුණතා දියුණු වීම.
මින් සමාජයට ලැබෙන ප්‍රතිලාභ වන්නේ,
1. B හා C ය.
2. A, D හා E ය.
3. A හා D ය.
4. B, D හා E ය.
5. C හා D ය.

39. විදුලි උපකරණයක් තත්පර එකකදි කරනු ලබන කාර්ය ප්‍රමාණය හඳුන්වනුයේ,
1. ප්‍රතිරෝධය ලෙසය.
2. ප්‍රත්‍යාවර්ථ ධාරාව ලෙසය.
3. ක්ෂමතාවය ලෙසය
4. වෝල්ටීයතාව ලෙසය.
5. ශේෂ ධාරාව ලෙසය.

40. සන්නායකයකින් විදුලි ධාරාවක් පිටතට කාන්දු වීම වැළැක්වීම සඳහා ගන්නා ආරක්ෂක පියවරකි.
1. උපපරිපත භාවිතය. 2. වෙන්කරණයක් භාවිතය 3. විලායක භාවිතය
4. පරිවාරක භාවිතය 4. පේනු භාවිතය

41. ශ්‍රී ලංකාවේ විදුලි බිල්පත සැකසීමේ යාන්ත්‍රනය සිදු කරනු ලබන ආයතනය වන්නේ,
1. විදුලි සංදේශ නියාමන කොමිසම 2. මහජන උපයෝගීතා කොමිසම
3. ලංකා විදුලි බල මණ්ඩලය 4. විදුලි අධිකාරිය
5. විදුලිබල මණ්ඩලය

42. නූතන ගෘහ පරිපථවල එකම ආවරණයක් තුළ සවිකර ඇති කොටස් වන්නේ,
1. වෙන්කරණය, ශේෂධාරා පරිපථ බිඳිනය, සිගිකි පරිපථ බිඳිනය
2. ප්‍රධාන ස්විචය, ශේෂධාරා පරිපථ බිඳිනය, සිගිති ධාරා පරිපථ බිඳිනය.
3. ශේෂධාරා පරිපථ බිඳිනය, විදුලි මීටරය, කෙවෙනිය.
4. ප්‍රධාන මීටරය, වෙන්කරණය, සිගිති පරිපථ බිඳිනය.
5. වොට් පැය මීටරය, වෙන්කරණය, ශේෂධාරා පරිපත බිඳනය

43. විද්‍යුත් ශක්තිය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. මින් නිවැරදි පිළිතුර තෝරන්න.
1. විදුලි ධාරාව මැනිමේ සම්මත ඒකකය වොට් වේ.
2. ජලය රත් කිරීම සඳහා වඩාත් වාසිදායක වන්නේ ගිල්ලුම් තාපකයයි.
3. ලෝහමය ආවරණයක් සහිත විදුලි උපකරණවලට තුන් කූරු පෙනු යෙදීම වඩාත් සුදුසුය.
4. ශ්‍රී ලංකාවේ ජාතික විදුලිබල පද්ධතිය මගින් නිවෙස්වලට සපයනු ලබන විදුලියේ වෝල්ටීයතාවය 280 කි.
5. ජාතික විදුලිබල පද්ධතියෙන් සපයන්නේ සරල ධාරා විදුලියකි.

44. විදුලි රැහැන් සම්බන්ධ කිරීමේදී සජීවී, උදාසීන රැහැන්වල සම්මත වර්ණ පිළිවෙළින්,
1. නිල් හා දුඹුරු වර්ණය. 2. දුඹුරු හා නිල් වර්ණය. 3. කොළ හා නිල් වර්ණය.
4. කොළ හා කහ වර්ණය. 5. දුඹුරු හා කොළ වර්ණය

45. ජල පරිභෝජනය මැනීමේදී ජල ඒකකයක් ලෙස අදහස් කරන්නේ,
1. ජල ඝන මීටර් එකක ප්‍රමාණයකි. 2. ජල ඝන ලීටර් ඒකක ප්‍රමාණයකි.
3. ජල ඝන මීටර් දහයක ප්‍රමාණයකි. 4. ජල ඝන ලීටර් දහයක ප්‍රමාණයකි.
5. ජල ඝන මීටර් පහක ප්‍රමාණයකි.

46. රනිල කුලයට අයත් ක්‍රියාකාරී ආහාරයකි,
1. සෝයා බෝංචි 2. බෝංචි 3. මුං ඇට 4. මෑ කරල් 5. කව්පි

47. රුධිර පීඩනය පාලනය කරන පැරණි දේශීය සහල් ප්‍රභේදයකි.
1. කීරි සම්බා 2. කලු හීනටි 3. සුදු කැකුළු 4. සුවඳැල් 5. සම්බා

48. විවිධ වගා ව්‍යුහ සඳහා භාවිතා කළ හැකි මෘදු අංග වන්නේ,
1. ප්‍රතිමා, විවිධ වර්ණ සහිත ශාක 2. ගල්කණු, විවිධ හැඩ සහිත ශාක
3. විවිධ වර්ණ ශාක හා විවිධ හැඩ සහිත ශාක 4. ප්‍රතිමා හා ගල් කණු
5. පොකුණු හා ප්‍රතිමා

49. පුණර්ජනනීය නොවනසම්පත් පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
1. නැවත ජනනය වීමේ හැකියාවක් නොමැති වීම.
2. ඉතා අවම ජනනය වීමේ හැකියාවක් තිබීම.
3. භාවිතා කරනවේගයට වඩා අඩු වේගයකින් ජනනය වීම.
4. ප්‍රතිචක්‍රීකරණය කළහැකි වීම.
5. පරිභෝජනය කරන වේගයට සමාන වේගයකින් ස්වභාවිකව ඉතා ඉක්මනින් ජනනය වීමට හැකියාව නොමැති වීම.

50. පෘථිවි පෘෂ්ඨය උණුසුම් කරන ස්වභාවික ක්‍රියාවලියකි.
1. නාය යාම 2. ජල ගැනීම 3. ප්‍රතිචක්‍රීකරණය
4. හරිතාගාර ආවරණයයි. 5. සුළි සුළං

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

28 | S | II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 13 - 2020**

විභාග අංකය .............................     ගෘහ ආර්ථික විද්‍යාව II     කාලය පැය තුනයි

**උපදෙස්:-**

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හයකට පිළිතුරු සපයන්න.**

01. (i) ගෘහ අභ්‍යන්තර අලංකරණයේදී යොදාගතහැකි උපාංග හතරක් සඳහන් කරන්න.
(ii) ආමාශයික ග්‍රන්ථිවලින් ශ්‍රාවය වන ශ්‍රාවයන් දෙකක් සඳහන් කරන්න.
(iii) ආහාරවල යකඩ පැවතිය හැකි ආකාර දක්වා ඊට උදාහරණ සඳහන් කරන්න.
(iv) දියවැඩියාව පාලනය කිරීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග හතරක් දක්වන්න.
(v) යෝගට් මිලදී ගැනීමේදී සැලකිලිමත් වියයුතු කරුණු දෙකක් දක්වන්න.
(vi) රෙදිපිළි නිෂ්පාදනයේදී යොදා ගන්නා පෙර පිරියම් කිරීමේක්‍රම හතරක් සඳහන් කරන්න.
(vii) විරංජනය සඳහා යොදාගනු ලබන ඔක්සිකාරක විරංජන දෙකක් නම් කරන්න.
(viii) සන්නිවේදනය සඳහා යොදාගන්නා මාධ්‍ය හතරක් සඳහන් කරන්න.
(ix) ආහාර මුඩුවීමට බලපාන හේතු දෙකක් දක්වන්න.
(x) 'හරිත පාරිභෝගිකයා' හඳුන්වන්න. (ල 2 x10 = 20)

02. (i) තුලනය මගින් නිර්මාණයකට අලංකාරයක් ගෙන දෙන ආකාර නම් කර පැහැදිලි කරන්න. (ල. 4)
(ii) (අ) අභ්‍යන්තර අවකාශය යනු කුමක්ද? (ල. 2)
(ආ) අභ්‍යන්තර අවකාශ නිර්මාණයේදී සලකා බලන සාධක කවරේද? (ල. 2)
(iii) ක්‍රියාකාරී ආහාර යන්න හඳුන්වා ඊට උදාහරණ හතරක් දක්වන්න. (ල. 4)
(iv) ආහාරමය භෝග වගාවකින් භූමි අලංකරණයේ ඇති වාසි සඳහන් කරන්න. (ල. 4)
(මුලු ලකුණු 16)

03. (i) ආමාශය තුළදී ආහාරවල සිදුවන වෙනස්කම් දක්වන්න. (ල. 4)
(ii) ප්‍රෝටීන ශක්ති මන්දපෝෂණයෙහි ආකාර දක්වා ඉන් එක් ආකාරයක් පැහැදිලි කරන්න. (ල. 4)
(iii) විටමින් A ඌනතාවයේ ලක්ෂණ සඳහන් කරන්න. (ල. 4)
(iv) මල බද්ධයෙන් පෙළෙන වැඩිහිටි කාන්තාවකට සුදුසු දිවා ආහාර වේලක බොජුන්පතක් සැලසුම් කරන්න. (ල. 4)

04. (i) ආහාර පරිරක්ෂණයේ මූලධර්ම සඳහන් කරන්න. (ල. 4)
(ii) 'විසිර වියළනය' පහදන්න. (ල. 4)
(iii) යෝගට් සෑදීමේ පියවර අනුපිළිවෙළින් දක්වන්න. (ල. 4)
(iv) ආහාර ඇසුරුමක් යන්න හඳුන්වා ඇසුරුමක් යෙදීමේ අරමුණු දක්වන්න. (ල. 4)

05. (i) නිමි ඇඳුම් කර්මාන්තයේදී ඇඳුම් මසා නිම කිරීමේ ක්‍රම පැහැදිලි කරන්න. (ල. 4)

(ii) මේස රෙද්දක් සඳහා රෙදි තේරීමේදී අවධානය යොමුකළ යුතු කරුණු 4ක් සඳහන් කරන්න. (ල. 4)

(iii) වානිජ මැහුම් ක්‍රමවල පෙනුම හා ක්‍රියාකාරිත්වය සඳහා බලපාන කරුණු පැහැදිලි කරන්න. (ල. 4)

(iv) නිමි ඇඳුම් කර්මාන්තයේදී මසන ලද ඇඳුමක නිමාව කෙරෙහි බලපාන කරුණු පැහැදිලි කරන්න. (ල. 4)

06. (i) රාශිගත සංචරණය හා විකල්ප සංචරණය අතර ඇති වෙනස්කම් දක්වන්න. (ල. 4)

(ii) සංචරයේ ධනාත්මක ආර්ථික බලපෑම් 4ක් සඳහන් කරන්න. (ල. 4)

(iii) හරිතාගාර වායු අවම කිරීමටඅනුගමනය කළහැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. (ල. 4)

(iv) ආහාර පිසිමේදී පිටවන විමෝචක අඩුකිරීම සඳහා ගතහැකි පියවර සඳහන් කරන්න. (ල. 4)

07. (i) ජලය පාවිච්චි කිරීමේදී යහපත්පුරුදු ඇතිකරගැනීම ජල සංරක්සණයට බෙහෙවින් උපකාරී වේ. සාකච්ඡා කරන්න. (ල. 4)

(ii) පානයකිරීමට සුදුසු ජලයේ තිබියයුතු ගුණාංග පැහැදිලි කරන්න. (ල. 4)

(iii) ජලයේ යෝග්‍යතාව, බැලීම සඳහා කරනු ලබන පරික්ෂණ උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 4)

(iv) විදුලි උපකරණ පරිහරණය කිරිමේදී පිළිපැදිය යුතු ආරක්ෂණ පූර්වෝපා දක්වන්න. (ල. 4)

08. පහත සඳහන් මාතෘකා අතුරෙන් 4ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) පළතරු ආහාරයට ගැනීමේ වැදගත්කම

(ii) මසර කිරීම.

(iii) ආහාර ප්‍රවීකිරණය

(iv) වැසි ජල සංරක්ෂණය.

(v) අධිධාරා පරිපථ බිඳිනය (ල. 4 x 4 = 16)